ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2008

අන්තර්ජාතික නීතිය - LWU 3315/4312/4335

කාලය - පැය තුනයි.

දිනය - 2008 අප්‍රේල් 09 වේලාව - පෙ.ව. 09.30 -ප.ව. 12.30 දක්වා

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. ආචාර්ය දිමිත්‍රි යාකොව්, 2008 ජනවාරි 1 වැනිදා කාබුල් රාජ්‍යයේ ග්‍රොස්නියා ජනරජ නව තානාපතිවරයා වශයෙන් පත් විය. කාබුල් හි නව පත්වීම පිළිගැනීම සඳහා හෙතෙම ග්‍රොස්නියාව විසින් පත් කල නව නිලධාරීන් තිදෙනා සමඟ ජනවාරි 2 පිටත් විය. මෙම ගමන සඳහා ඔහුගේ පවුලේ සාමාජිකයන්ද, ඥාති සොහොයුරන් සිව් දෙනෙකු ද සහභාගි වූහ. ගමන අතරතුර ඔවුහු ස්ථාන දෙකකදී නැවතුනහ. ප්‍රථමයෙන්, ලුබායි හිදී ඔහු දින දෙකක් නැවති සිටියේය. ඔහු ලුබායි හි සිටින අතරතුර කිසියම් පාර්සල් කිහිපයක් ද සමඟ ඔහු වෙත එළඹුනු නාඳුනන පුද්ගලයන් කිහිප දෙනෙක් සමඟ ඔහු කතා කරනු හා පාර්සල් ඔහුගේ නිලධාරීන් වෙත බාර දෙනු දැක තිබිණි. තවද සිය දෙවන තෙදින නැවතුම වූ විඩිනි හිදී ඔහු පුද්ගලයකු සමග සාකච්ඡා කරනු හා යම් ලේඛණ කිහිපයකට අත්සන් තබනු දැක තිබුණි. එසේ නැවති සිටියදී ආචාර්ය යාකොවිගේ තරුණ පුතුන් හා ඥාති සොහොයුරන් සාප්පු සවාරියේ ගිය අතර විඩිනි රජයට එරෙහිව පැවති උද්ඝෝෂණයකටද සහභාගි වූහ. පසුව උද්ඝෝෂණය ප්‍රචණ්ඩකාරී වූ අතර ආචාර්ය යාකොවිගේ පුතුන් හා ඥාති සොයුරන් ඇතුළු උද්ඝෝෂණකරුවන් විසින් රජයේ දේපළවලට අලාභ හානි කිරීම හා කැරලි ගැසීමේ චෝදනාව මත විඩිනි පොලිසිය මගින් අත් අඩංගුවට ගන්නා ලදී.

මේ අතර ආචාර්ය යාකොව් හා ඔහුගේ බිරිඳ කාබුල් ජාත්‍යන්තර ගුවන් තොටුපොළට ලඟා වූහ. තමන් ලද විශ්වාසවන්ත තොරතුරු අනුව ක්‍රියා කරමින් රේගු නිලධාරීන් විසින් ආචාර්ය යාකොව් හා ඔහුගේ පවුලට අයත් ගමන් මළු නතර කරන ලදී. විමර්ෂණයේදී කාබුල් හි සමාන අයිතිවාසිකම් ඉල්ලා සටන් වදින කණ්ඩායමක් යටතේ පවතින ඇත ගමක පදිංචි පුද්ගලයකුට යොමු කරන ලද අති නවීන ආයුධ පිළිබඳ විස්තර සහිත පොත් කිපයක් හා අති නවීන රේඩියෝ සන්නිවේදන උපකරණ කට්ටලයක් ද පොලිසිය විසින් සොයා ගන්නා ලදී. මෙම ද්‍රව්‍ය සොයාගනු ලැබුවේ යාකොව් මහත්මියගේ ගමන් මල්ලෙනි. පවත්නා හදිසි නීති රෙගුලාසි යටතේ සටන්කාමීන්ට භාරදීමේ චේතනාව මත තහනම් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් කාබුල් පොලිසිය විසින් ආචාර්ය යාකොව් හා ඔහුගේ භාර්යාව අත් අඩංගුවට ගන්නා ලදී.

සමස්ත සිද්ධියේ නෛතික ගැටළු සාකච්ඡා කරන්න.

02. " 'වල නාහයයේ' පුළුල් හා අසාධාරණ භාවිතය අධිකරණ මගින් යම් නිශ්චිත සීමා සහිත අවස්ථාවන්ට සීමා කර ඇත."
ඉහත කියමන සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

03. ස්වාධිපත්‍යය, ස්වයං නිර්ණය හා පිළිගැනීම රාජ්‍යත්වයේ වැදගත් කුළුණු තුනක් ලෙස සැලකේ. කෙසේ වුවද ඒවායේ ප්‍රායෝගික හා සාපේක්ෂ වැදගත්කම නූතන දේශපාලන තත්ත්වයන් මගින් නිරතුරුව පරීක්ෂාවට ලක් කෙරේ.

උදාහරණ ද සහිතව ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

04. පහත දැක්වෙන අවස්ථාවන්ට අදාළ නෛතික කරුණු සාකච්ඡා කරන්න.

(අ) ටෙන්යා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ මහා මැතිවරණයකින් පසුව මැතිවරණය නීතිවිරෝධී හා අසාධාරණ බව පවසමින් ගෝත්‍ර පක්ෂ දෙකක් අතර දරුණු ගැටුම් හට ගැණිනි. ඝාතන හා දැඩි ලෙස මානව හිමිකම් උල්ලංඝනය වීම් දිනපතා වාර්තා විය. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 7 වන පරිච්ඡේදය අනුව ක්‍රියා කරමින් ටෙන්යාවට සාම සාධක හමුදාවක් යැවීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලය තීරණය කළේය. රොමාලියාව, සිසිලි හා වික්ටෝරියා රාජ්‍යයන්ගේ සොල්දාදුවන්ගෙන් සමන්විත වූ සාම හමුදාව 2007 මාර්තු මසදී ටෙන්යාවට පැමිණියේය. සාම සාධක හමුදා සාමාජිකයින් විසින් මිනී මැරීම, ස්ත්‍රී දූෂණය හා පහරදීම් වැනි බරපතල අමානුශික ක්‍රියාවන්හි යෙදී ඇති බව 2007 දෙසැම්බර් වන විට ටෙන්යාව එක්සත් ජාතීන්ගේ සංවිධානයට පැමිණිලි කර සිටියේ ය.

(ආ) තම කලාපය තුල වර්ධනය වෙමින් පවතින නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය නැවැත්වීම සඳහා බීමා, කැන්කුන්, බොගෝටා හා මිලි රාජ්‍යයන් විසින් නීති විරෝධී මත් ද්‍රව්‍ය ප්‍රවාහනය නැවැත්වීමේ ගිවිසුමකට එළඹෙන ලදී. මත් ද්‍රව්‍ය ව්‍යාපාරයට පහසුකම් සලසන්නා සේ හැඟෙන ක්‍රියාකාරකම් කිහිපයක් ගිවිසුමේ උපලේඛණය මගින් තහනම් කර ඇත. එම තහනම් ක්‍රියාවන් අතර අබිං වැවීම, නඩත්තු කිරීම හා ප්‍රවාහනය ඇතුළත් වේ. ගිවිසුමට එළඹීමෙන් පසු පවා බොගෝටා රාජ්‍යයේ ගෘහ බෝගයක් ලෙස අබිං වගා කරන බවත් රාජ්‍ය අනුග්‍රහය එයට ලැබෙන බවත් මාස කිහිපයකට පසු බීමා, කැන්කුන් හා මිලි රාජ්‍යයන්ට දැන ගැනීමට හැකිවේ.

05. "සෑම ස්වෛරී ස්වාධීන රාජ්‍යයක්ම යුද්ධ කිරීමට ඇති අයිතිය භුක්ති විඳ"
අදහස් දක්වන්න.

06. (අ) සම්මුතියක් නිති විරෝධීභාවයට පත් වීමේ, අවලංගු වීමේ හෝ අත්හිටුවීමේ ක්‍රම සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර සනාථ කිරීමට උදාහරණ ඉදිරිපත් කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

(ආ) බනානා ජනරජය හා ඇපල් රාජ්‍යය පැසිෆික් සාගරයට මුහුණ ලා පිහිටි වෙරළාශ්‍රිත රාජ්‍යයන් වේ. එම රාජ්‍යයන් දෙකෙහි සිට නාවික සැ. 20 ක් ඇතුලත මුහුදේ අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් බනානා ජනරජය හා ඇපල් රාජ්‍යය 2000 වසරේදී ගිවිසුමකට එළැඹුනහ. මෙය වෙරළාශ්‍රිත රාජ්‍යයන් විසින් බොහෝ කලක පටන් අනුගමනය කරන ලද භාවිතාවකි. බනානා හි අසල්වැසි පිවී රාජ්‍යයේ විදේශ කටයුතු අමාත්‍යවරයා 2001 වසරේ දී බනානා හි සිදුකල නිල සංචාරයකදී තම රාජ්‍යය මෙම ගිවිසුමේ ප්‍රතාපාදන වලට සම්පූර්ණ සහය පලකරන බවට ප්‍රසිද්ධියේ කියා සිටියේය. මේ අතර මෙම භාවිතාවට නිරන්තරයෙන් දැඩි විරෝධය පල කල මෙලන් රාජ්‍යය මුහුදේ නා.සැ. 20 සීමාවේ අපද්‍රව්‍ය බැහැර කිරීම නොනවත්වා සිදු කලේය. 2006 වසරේදී වැඩිවූ ජනගහනය හේතුවෙන් පිවී රාජ්‍යය මුහුදේ නා.සැ. 18 ක් තුල අපද්‍රව්‍ය බැහැර කිරීමට පටන් ගත්තේය.

පිවී හා මෙලන් රාජ්‍යයන්හි වැරදි සහගත ක්‍රියාකලාපයන්ට එරෙහිව බනානා ජනරජය හා ඇපල් රාජ්‍යයය විසින් ජාත්‍යන්තර යුක්ති අධිකරණයේ නඩුපවරන ලදී.

ජාත්‍යන්තර යුක්ති අධිකරණය මගින් අනුගමනය කල හැකි නිති පිළිබඳව පාර්ශ්වයන්ට උපදෙස් දෙන්න.

07. පහත ඕනෑම **දෙකක්** පිළිබඳව සටහන් ලියන්න.

(අ) රාජ්‍ය ක්‍රියා නැමැති සිද්ධාන්තය

(ආ) එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රතිසංස්කරණය කිරීම

(ඇ) ජාත්‍යන්තර යුක්ති අධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරවා ගැනීම

08. මිනර්වා සමාජවාදී ජනරජය රන් අපනයනය කිරීම මත මහත්සේ යැපෙන සංවර්ධනය වෙමින් පවතින රටකි. 2007 දෙසැම්බර් මස දී එක්සත් ජාතීන්ගේ මිනර්වා නිත්‍ය නියෝජිතවරයා විසින් ත්‍රස්තවාදයට එරෙහි නවතම සම්මුතිය වන 2006 ත්‍රස්තවාදය සහමුලින් පිටුදැකීමේ කොළඹ සම්මුතිය අපරානුමත කල අතර එමගින් සම්මුතිය බලාත්මක කෙරිනි. සාමාන්‍යයෙන් ප්‍රකාශිත ව්‍යවස්ථා පැණවීමකින් තොරව ජාත්‍යන්තර සම්මුතීන් හි ප්‍රතිපාදන මිනර්වා රාජ්‍යයේ දේශීය නීතියේ කොටසක් බවට පත් නොවේ. ගෝල් රාජ්‍යයේ ක්‍රියාත්මක ත්‍රස්තවාදී කණ්ඩායමකට අවි ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් අරාබියානු පොලිසිය විසින් මිනර්වා දේශයේ පුරවැසියකු වන බිනු 2008 ජනවාරි මාසයේදී අත් අඩංගුවට ගන්නා ලදී. ගෝල් දේශයට අවි ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් වඩාත්ම අවශ්‍ය පුද්ගලයන්ගේ ලැයිස්තුවේ ඉහලින්ම බිනු සිටින බව පසුව අනාවරණය විය. මිනර්වා හා ගෝල් රාජ්‍යයන් දෙකම බිනු තම රාජ්‍යයන්ට උදර්පනය කරන ලෙස ඉල්ලා සිටියහ. අරාබියාව මානුෂික හේතු මත බිනු උදර්පනය කිරීම ප්‍රතික්ෂේප කරයි.

(සැලකිය යුතුයි - මිනර්වා හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන වන අතර ගෝල් හා මිනර්වා රාජ්‍යයන් අරාබියාව සමග ද්වි පාර්ශ්වික උදර්පන සම්මුතීන් වලට එළඹ ඇත.)

(අ) බිනුට එරෙහිව නඩු පැවරිය හැක්කේ කවර පදනමක් යටතේ කිනම් රාජ්‍යයකට දැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ආ) බිනු, මිනර්වා දේශයට උදර්පනය කරන්නේ නම් හා මිනර්වා දේශය විසින් 2006 කොළඹ සම්මුතියේ ප්‍රතිපාදන යටතේ ඔහුට එරෙහිව ක්‍රියා කිරීමට අදහස් කරන්නේ නම් තත්ත්වය කෙබඳු වේ ද?

(ඇ) අරාබියාව බිනුට එරෙහිව නඩු පැවරීමට අපොහොසත් වන්නේ නම් හෝ අකමැති වන්නේ නම් ඔබේ මතය අනුව මිනර්වා හා ගෝල් රාජ්‍යයන්ට ඇති ප්‍රතිකර්ම මොනවා ද?

- නිමිකම් ඇවිරිණි. -